පළාත්සභා මැතිවරණ කියන්නේ කුමක් ද?

දකුණු පළාත් සභාවෙන් එක්සත් ජනතා නිදහස් සන්ධානය තුනෙන් දෙකක ජයග්‍රහණයක් ලබා ඇත. පළාතේ සියළු මැතිවරණ දිස්ත්‍රික්කවල, පැරණි ක්‍රමයේ ආසනවල ජය සංධානයට ය. වෙනත් වචනවලින් කියන්නේ නම් පැරණි ක්‍රමයේ පාර්ලිමේන්තු මැතිවරණයක් වී නම් සංධානය දකුණු පළාතේ සියළු ආසන දිනීමට තිබිණි. සන්ධානය දිනාගත් ඡන්ද සංඛ්‍යාව ද පසුගිය පළාත් සභා මැතිවරණයේ දී එය ලබාගත් ඡන්ද සංඛ්‍යාවට වඩා වැඩි ය. එහෙත් එ ජා පක්ෂයටත් ජ වි පෙරමුණටත් සන්ධානයේ පසු බැසීමක් ගැන කතා කිරීමට ඉඩ ලැබී ඇත. එයට හේතුව කුමක් ද?

විපක්ෂයට එවැනි කතාවක් ප්‍රචාරය කිරීමට ඉඩ ලැබීම ගැන පළමුවෙන් ම වගකිව යුතු වන්නේ සන්ධානයේ මැති ඇමතිවරුන් ය. ඔවුහු දකුණු පළාත් සභා මැතිවරණයේ දී ඌවේ දී සංධානය ලබාගත් ප්‍රතිශතයට වඩා ඡන්ද ප්‍රතිශතයක් ලබාගන්නා බවට වහසි බස් දෙඩූහ. ජනාධිපතිතුමාගේ ගම් පළාතෙන් (සිංහලයන් ගම් පළාත යනුවෙන් හඳුන්වන්නේ සුද්දන්ගේ පළාතක් නොවීම යන්න වෙනත් කරුණකි) ඌවට වඩා ඡන්ද ප්‍රතිශතයක් ලැබීම නියත බව ඔවුහු කීවෝ ය. එහෙත් ප්‍රතිඵල එසේ නොවූයේ ජනාධිපතිතුමා ද මැතිවරණ ව්‍යාපාරයට වෙනත් පළාත් සභා මැතිවරණවල දීට වඩා සහභාගි වීමෙන් පසුව ය. විපක්ෂයට එකම ආසනයක්වත් දිනාගැනීමට නොහැකිවීත් ඔවුන් ප්‍රතිශත ගැන කතාකරමින් සන්ධානය පසුබෑමකට ලක් වී ඇති බව පවසන්නේ ඌවට වඩා ඡන්ද ප්‍රතිශතයක් දකුණේ දී ගැනීමට සන්ධානය අසමත් වී ඇති බැවිනි.

විශේෂයෙන් ම හම්බන්තොට දිස්ත්‍රික්කයේ දී සන්ධානය දිනාගත් ඡන්ද ප්‍රතිශතය 2004 දී ඔවුන් එහි දිනාගත් ප්‍රතිශතයට වඩා අඩු වී ඇත. 2004 දී 70% ක්වූ ප්‍රතිශතය මෙවර 67% දක්වා අඩු වී ඇත. පසුගිය වතාවේ ජ වි පෙ සන්ධානය සමග එකට තරග කළ බැවින් මෙවර ජ වි පෙ දිනාගත් 11% සන්ධාන ඡන්ද ප්‍රතිශතයට එකතු කළ යුතු බවත් එසේ කිරීමෙන් සන්ධානයේ ඡන්ද 67% සිට 78 % දක්වා වැඩිවන බවත් කෙනකුට කිව හැකි ය. ප්‍රතිශත ඒ ආකාරයෙන් එකතු කළ නොහැකි වුවත් මේ තර්කයේ යම් වලංගු බවක් නැතිවා නො වේ. එහෙත් ඒ ඡන්ද ප්‍රතිශතය ද ඌවේ ඇතැම් දිස්තික්කවල සන්ධානයේ වැඩි වූ ඡන්ද ප්‍රතිශතයට වඩා අඩු ය.

ඒ අතර ගාල්ල හා මාතර දිස්ත්‍රික්ක දෙකේ සන්ධානය 2004 දී ලබාගත්තාට වඩා ඡන්ද ප්‍රතිශත පිළිවෙළින් 62 සිට 68 දක්වාත් 64 සිට 67 දක්වාත් වැඩිකර ගත්තේ ජ වි පෙ නැතිව ය. එබැවින් යමකුට තර්ක කළ හැක්කේ හම්බන්තොට දී සන්ධානයේ ඡන්ද ප්‍රතිශතය අඩු වී ඇති බව ට ය. ඡන්ද ප්‍රතිශත ඉහළ යෑම හෝ පහළට වැටීම සාපේක්ෂ ය. ඒ ගණනය කරන්නේ එම දිස්ත්‍රික්කයේ හෝ පළාතේ හෝ කලින් මැතිවරණයකදී ලබාගත් ඡන්දවලට සාපේක්ෂව ය. එහි වරදක් නැත. එහෙත් යම් පක්ෂයක් දිස්ත්‍රික්කයක මෙවර ලබාගත් ඡන්ද ප්‍රතිශතය තවත් දිස්ත්‍රික්කයක ලබාගත් ඡන්ද ප්‍රතිශතය සමඟ සසඳා ජය පරාජය තීරණය කිරීමට යෑම පදනම් විරහිත ය. එහි න්‍යායක් හෝ තර්කයක් හෝ නැත. එබැවින් සංධානය මෙවර ඌවේ ලබාගත් ඡන්ද ප්‍රතිශතය දකුණෙන් ලබා නොගැනීම හේතුවෙන් ඒ පක්ෂය දකුණේ දී පසුබෑමකට ලක් වී ඇතැයි කිව නො හැකි ය.

එහෙත් කලින් සඳහන් කළ අයුරින් මෙවැනි ක්‍රම විරෝධී තර්ක ගෙන ඒමට පසුබිම සකස්කර දීමෙන් සන්ධානයේ දේශපාලනඥයෝ ද වරදක් කළහ. මැතිවරණ ව්‍යාපාරයේ දී ඔවුන්ගේ පාරම්බෑම් ඇසූ ජනතාව සන්ධානය දකුණෙන් 90%ක ඡන්ද නොගැනීම නිසා පසුබෑමකට ලක් වී ඇත යන නිගමනයට පැමිණ ඇති නම් හා විපක්ෂයට එසේ කීමට අවස්ථාව ලැබී ඇත්නම් එහි වරද සන්ධානය මත පැටවීමට විරුද්ධ විය  නො හැකි ය. මැතිවරණයට කලින් එ ජා ප ඡන්ද පෙට්ටි මංකොල්ලයක් ගැන කතාකෙළේ ද සාමාන්‍ය තත්වයන් යටතේ සංධානයට 90% ඡන්ද ප්‍රතිශතයක් ලබාගැනීමට නොහැකි බව තක්සේරු කළ නිසා විය හැකි ය.

ඒ කුමක් වුවත් සියළු පළාත් සභා මැතිවරණ අවසන් වීමෙන් පසු වර්තමාන ජන විඥානය ගැන පැහැදිලි යමක් කිව හැකි ය. මෙරට ජනයා අද සාමාන්‍යයෙන් ඡන්දය ප්‍රකාශ කරන්නේ සිංහල, උතුරේ දෙමළ, නැගෙනහිර දෙමළ, වතුකරයේ දෙමළ, නැගෙනහිර මුස්ලිම්, අනෙක් පළාත්වල දෙමළ හා මුස්ලිම් වශයෙන් බෙදී ය. පනස්හයෙන් පසුව සිංහලයන් බහුතරයක් එක් කණ්ඩායමක් ලෙස ඡන්දය දෙන පළමු අවස්ථාව වර්තමානයෙහි එළඹී ඇත. අද සිංහලයන් විශාල බහුතරයක් ඇති පැරණි ක්‍රමයේ එක් මැතිවරණ කොට්ඨාශයක්වත් එ ජා පක්ෂයට දිනාගත නො හැකි ය.

© Prof. Nalin De Silva

පනස්හයේ දී ඒ ජා පක්ෂය මෙයට සම්ප තත්වයන් යටතේ ආසන අටට පල්ලම් බැස්සේ ය. අද මෙන් ම එදා ද ශ්‍රී ල නි පක්ෂය ( එදා සන්ධානය ම ඒ පෙරමුණ විය) සිංහලත්වයේ පක්ෂය විය. ජනතාව ශ්‍රී ල නි පක්ෂයට එදා ඡන්දය දුන්නේ ඇතැම් කසිකබල් මාක්ස්වාදීන් කියන ආකාරයට පනස්තුනේ හර්තාලයෙන් ඔදවැටී නො වේ. මැතිවරණ වේදිකාවේ ආර්ථික කරුණු නොව සිංහලය රාජ්‍ය භාෂාව කිරීම ප්‍රධාන මාතෘකාව බවට පත්විය. දෙමළ ත්‍රස්තවාදය නිර්මාණය වූයේ සිංහලය රාජ්‍ය භාෂාව කිරීම නිසා යැයි කියන පඹ කතාව ප්‍රලාපයක් පමණක් බව අපි නොයෙක් වර පෙන්වා දුන්නෙමු. ඉන් දෙමළ ජනයාට හෝ දෙමළ භාෂාවට හෝ කිසිම අසාධාරණයක් සිදු නොවූයේ දෙමළ මෙරට කිසි දිනෙක රාජ්‍ය භාෂාව වී නොතිබීම නිසා ය. ඉංගිරිසිය වෙනුවට සිංහලය රාජ්‍ය භාෂාව කිරීම නිසා ඉංගිරිසියට හා බර්ගර් ජනයාට යම් අසාධාරණයක් සිදු වී යැයි කිසිවකු කියන්නේ නම් තර්කය දුර්වල වුවත් එහි අසා සිටීමට තරම් දෙයක් ඇත. එහෙත් දෙමළ ගැන එවැනි කිසිම කතාවකට ඉඩ නැත.

හැත්තෑහතේ දී පොදු පෙරමුණ ද එවැනි පල්ලම් බැසීමට ලක්වුව ද ඒ ආර්ථික කරුණු පදනම් කරගනිමිනි. පාන් පෝලිම් හාල් පොලුවලට විරුද්ධව ජනතාව ජේ ආර් ජයවර්ධන පොරොන්දු වූ ඇට අටට වශී වූහ. ඒ අවස්ථාවල දී හැරුණු කොට සිංහල ජනතාව ඒ ඒ ඡන්ද කොට්ඨාශවල ප්‍රශ්න, අපේක්ෂකයන්, සාම්ප්‍රදායික ඡන්ද දීමේ රටාවන් අනුව ඡන්දය දුන්හ. පනස්හය හා ඉන් පනස්වසරකට පමණ පසු එළඹී ඇති නූතන පනස්හය (මේ පනස්හයේ උදාවීම පිළිබඳ අප අනාවැකි කියා ඇති බව පමණක් මෙහි දී සඳහන්කිරීම අවශ්‍ය වෙයි. චන්ද්‍රිකාගේ ආගමනය රටට අහිතකර බව කල්තියා දැන ඇය පාලනය කිරීම්වස් මැතිවරණයට මුහුණදීමෙන් පසු ම ඒ පෙ අනුපහේ දී පාණදුරේ දී පැවැත් වූ රැස්වීමක ප්‍රධාන සටන් පාඨය වූයේ පනස්හයක් ළඟ එනවා එකට අප සැරසෙනවා යන්න ය) අතර තවත් සමානකමක් ද වෙයි. එදා ඒ ජා ප නායකයා ද මෙදා ඒ ජා ප නායකයා ද ජාතිකත්වයෙන් බැහැර වූවෝ ය.

ඒ ජා පක්ෂයට සාම්ප්‍රදායිකව ඡන්දය දුන් අය අතර ජාතිකත්වය අගයන්නෝ ද වූහ. සේනානායකවරු ජාතිකත්වය අගය කරන්නන් බවට ඇතැම් සිංහලයන් අතර මතයක් ගොඩනැගී තිබුණි. විශේෂයෙන් ම මාක්ස්වාදීන් සමග සංසන්දනය කිරීමේ දී සේනානායකවරුන්ගේ ජාතිකත්වයට යම් ළියක් වැටුණු බව අමතක නොකළ යුතු ය. එදා ඒ ජා පක්ෂයට ඡන්දය දුන් විශාල පිරිසක් ද අද සන්ධානයට ඡන්දය දෙති. කලින් ඒ ජා ප ජයගත් ආසනවල සන්ධානය වැඩි ඡන්ද ප්‍රතිශත ලබන්නේ නම් එයට හේතුව ජාතිකත්වය අගය කරමින් ඒ ජා පක්ෂයට ඡන්දය දුන් බොහෝ දෙනකු අද සන්ධානයට ඡන්දය දීම ය. විශේෂයෙන් ම ඌව පළාතේ සිදුවූයේ එය ය. දකුණු පළාතේ ද අම්බලන්ගොඩ වැනි ආසනවල සන්ධානයට වැඩි ඡන්ද ප්‍රතිශතයක් ලැබී ඇත්තේ එබැවිනි. සිංහලයන් බහුතරයක් සිටින මන්ත්‍රී කොට්ඨාශවල පොදුවේ ගත්කල අද සන්ධානයට 75% (5% පමණ අඩුවැඩියක් සහිතව) පමණ ඡන්ද ප්‍රමාණයක් ලැබෙයි. මේ නූතන පනස්හයේ ප්‍රතිඵලයකි. ඒ හේතුවෙන් 35%-40% පමණ වූ ඒ ජා ප ඡන්ද පදනම කඩා වැටී ඇත. සිංහලයන් බහුතරයක් සිටින මන්ත්‍රී ආසන රාශියක් සහිත පළාත්වල වර්තමානයෙහි සන්ධානයට තුනෙන් දෙකක ජයග්‍රහණයක් ලබාගත හැකි ය.

එහෙත් එසේ නොවන ගාල්ල, කොළඹ නාගරික සභාවේ සීමාව තුළ වූ ඡන්ද කොට්ඨාශ ආදියෙහි සන්ධානයට 65% ක වත් ප්‍රතිශතයක් ලබාගැනීමට නො හැකි ය. මෙහි තේරුම නම් ලංකාවෙන් ම තුනෙන් දෙකේ බහුතරය සහිත ජයග්‍රහණයක් ලැබීමට සන්ධානයට ඇති හැකියාව ප්‍රසාද (බෝනස්) ආසන, ජාතික ලැයිස්තුවෙන් ලැබෙන මන්ත්‍රී ධුර, ශේෂයට ලැබෙන මන්ත්‍රී ධුර ආදිය මත රඳා පවතින බව ය. එවැනි ජයග්‍රහණයක් ලැබීමට ඉඩක් ඇති නමුත් ඒ ගැන ස්ථිරව කිව නො හැකි ය. නැගෙනහිර දෙමළ හා කඳුකරයේ දෙමළ ඡන්ද සන්ධානයට ලැබිය හැකි නමුත් උතුරු පළාතේත් කොළඹ හා අනෙක් දිස්ත්‍රික්කවලත් දෙමළ ඡන්ද සන්ධානයට ලැබේ යැයි සිතිය නො හැකි ය. එහෙත් සිංහල බහුතරයක් ඇති මන්ත්‍රී කොට්ඨාශවල සන්ධානයට 85%ක ඡන්දයක් ලැබෙන්නේ නම් සන්ධානයට නිසැකව තුනෙන් දෙකක බහුතරය සහිතව ජයග්‍රහණය කිරීමට හැකි ය. පළාත් සභා මැතිවරණවලින් කියැවෙන්න පැහැදිලි ය. සිංහල ජනයා විශාල බහුතරයක් වූ ඡන්ද කොට්ඨාශවල සන්ධානයට 75%ක පමණ ඡන්ද ප්‍රමාණයක් ලැබෙයි. මේ ජාතිකත්වයේ ප්‍රතිඵලයක් මිස අනෙකක් නො වේ. සන්ධානයට ඒ ඡන්ද ලැබෙන්නේ එය වර්තමානයේ ජාතිකත්වයෙහි පිහිටා ඇති බැවින් සහ දෙමළ ත්‍රස්තවාදය පැරද වූ දේශපාලන හා හමුදා ඒකකය තවමත් එකට සිටින බැවින් ය.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva